*ගර්භ ළමයා නොපෙරලෙනවාට. -*

ගර්භ ළමයා නොපෙරලෙනවාට දියමිත්ත කොළ යුෂ පොල්කිරෙන් දෙනු. ගර්භ කසායට ඉඟුරු, තිප්පිලි, කොතඹුරු, කලුදුරු, සත්ද ඇත් දෙඹට, නිකමුල්, කලාදුරු අල, මේවා අට එකට කකාරා දෙනු. මීටම දියමිත්ත අමෘත සැවැන්දරා, කලාදුරු, ඉඟුරු, වැල්කැප්පෙටියා මුල් මේවා එකිනෙක එක කලං මංචාඩි පහළොව ගෙන තැඹිලි දියෙන් අටිනෙක සිඳ සීනි මුසුව දෙනු. ගර්භනීන්ගේ උණ ආදි සියලු ලෙඩට යහපොති.

***ගර්භිණීන්ගේ ඉකිලි කැක්කුමට. - කසායට***

නික, සුදු පිටවක්කා. කොසඹ, වැල්කහඹිලියා මෙකී නැටි, ත්‍රිපලා, ත්‍රිවිධ, තිප්පිලි, මොදගං, දෙදුරු මේවා කොටා අට එකට කකාරා දෙනු. ගර්භ උණ වමනේට ඉකිලි කොන්ද කැක්කුන්, ගිනියං රුදා ගුණවෙයි. මීටම දෙහි දොඩං , නික, පාවට්ටා, කොයඹ, කරපිංච මෙකී නැටි හාතාවාරිය අල, ඉඟුරු මේ හැම කොටා අට එකට කකාරා එඬරු තෙල් මුසුව දෙනු. මින්ගුණ ගර්භනින්ගේ අත්කකුල් දිග යන රුදුවට, කොන්දේ තුනටිය කකියනවාට, යටිබඩ කකියනවාට, ඉකිලි කකියනවාට, බඩ පිපුමට, පපුවේ ගිනියමට, වාත රුදවට, යක්ෂ ගිනියමට යහපොති. ගර්භ ඉදිමුනට සහ අනෙකුත් රෝගෙට වදංඩ බැරුවාට. ඊට ඉදිමුනට සහ අන්කුත් රෝගවලට කසායට අමු ඉඟුරු ඉස්ම පතයි, උක්පැණි පතයි, දෙහි අඹුල් පතයි මෙවා සැලක වක්කර ලිප තියා මීට දෙදුරු මෝදක, ත්‍රිවිධ ඉඟුරු මිරිස්, ත්‍රිපල් මෙකීවා අඹරා ඊට යොදා කකාරා කායංකර දෙනු. ඉසපැං එක්කරනු, ලුනු අඹුල් වලකිනු. මින්ගුණ ගර්භිණීන්ගේ අතපය දිගයන රුදවට ද බඩ පිපුමට ද අතපයවල් වලංගුනැතුවාට ද ඉදිමුනට ද අසූවක් වායුවට ද මෙකී ලෙඩ ගුණවෙයි.

වැදැමහ වැටෙන්ඩ

කපුකොළ මුල් කොටා කකාරා දෙනු. වදත් වැදැමහ වැටෙයි. මීටම සුදුලුනු ගෙඩි තුනක්, වරාකොළ තුනක් අකුලා උනු අළුවෙන් තම්බා මිරිකා එඬරු තෙලට යෙදා මී පැණියෙන් දෙනු. මීටම හදුන් වැල්මී ගිතෙලත් දෙනු. මීටම උප්පැණි පතයි, මිටි පොල්කිරි පතයි, වැල්මී කලදයි මේවා කලතා පොවනු. සැනෙන් වදත් අත්දුටුවයි. මීටම සීනි පතයි, වැල්මී කලදයි, එළකිරි පතයි, කසපැන් දිය පතයි, තලතෙල් පතයි, කුඹුක් කොළ නානු අනා යොදා දෙනු බිහි වෙයි.

*වදන්ඩ බැරිවාට මංතරේ. -*

***"ඔන්නමො සිද්ධාර්ථ කුමාරයෝ උපන්වන දිනයෙහි මහිකාන්තාවෝ දෙස්කී හෙයින් කලුගල් රුසියා නොමළහෙයින් අහසේ වැඩසිට පොළොවේ වැඩසිට බඩ රත්නයාගේ බිහිවෙන් පුතා බිහිවෙන්."*** මෙහි ක්‍රමයනම් එකසිය අටවරක් තෙල් මතුරා බොන්ට දෙනු. බිහිවෙයි. බඩේ ගානු වදත් පොල් ගෙඩියට එම ගනං මතුරා දොරකඩ තියා එකපාරට බිදිනු බිහිවෙයි අත්දුටුවයි.

*වදන්ඩ කොටන බේත්. -*

ඉරමුසු මුල්, කතා නොකර පිටතිං උදුරා දොරකඩ හිට හත් පියවරක් මැන එතන වංගෙඩිය ගොඩනගා බේත දමා තුන්පාරක් කොටනු වදත් වැදැමහ වැටෙයි. අත්දුටුවයි. වැල්මී ගිතෙලින් පොවනු බිහිවෙයි.

*වැදැමහ වැටෙන්ඩ කඳගැට රුජාවට මළදරුවො වැටෙන්ඩ.*

මිනී ඉස්කබල් තල තෙලෙන් ගලගා යටිපල්ලේ ගානු බිහිවෙයි. හනිකට සෝදා දමනු. වැදැමහ වැටෙන්ඩ ඔලිඳ මුල් කොටා මිරිකා පොවනු වැටෙයි. කඳට අඹ පොත්ත කාඩියෙන් අඹරා පොවනු කඳ හිටී. කඳගැට රුජාවට තිප්පිලි, කිකිරිදිය, යුසගෙන පොවනු කඳගැට රුජා හිටී.



*මළ දරුවෝ වැටෙන්ඩ. -*

සීනක්කාරං පුස්කර රත්කර අඹරා තල තෙලෙන් පොවනු බිහිවෙයි. මළකුණ වැටෙයි. කපුකොළ කොටා පොට්ටනි බැඳ තවනු වදත්, උදුපියලිය කොළලුනු දියෙන් පොවනු යටිබඩේ ගානු පෙකණියේ ගානු. බිහිවෙයි.

*අමාරුවට කරන වෙදකං*

ගල්කුරමුල්, කරල්සැබෝ මුල්, ඉස සිට දෙපතුලට පිය පාමුල දමනු වදත්. මීටම නියගලා අල, සැවැන්දරා මුල් මී පැණියෙන් අඹරා නාබියේ යටිපල්ලේ, යටිබඩේ, ඉස්මුදුනේ ගානු සැනෙකින් සෝදා හරිනු. මීටම නැගෙනහිරට ගිය පුහුල් මුල උදුරා ඉසේ බඳිනු වදත්.

*මළ දරුවෝ වැටෙන්ඩ නිල බේත්. -*

උතුරට ගිය එඬරු මුල උදුරා විල්ලඹු ගැහිගේ අතට ගෙන දෝතපානු වදත්. මීටම බෙලිගහේ පිලිලේ ඇල් දියෙන් අඹරා පොවනු මළ දරුවො වැටෙත්. පිටවක්කා මුල් තල තෙලෙන් දෙනු මළදරුවො වැටෙයි. මීටම උලුහාල් තලතෙලෙන් අඹරා පොවනු මළදරුවො වැටෙයි. "ඕන්යෙලගුරුවා නෙස්වඃ".ඉස්ගැනට වතුර මතුරා පොවනු. ඉස්ගැන හැරී සැපසේ වදයි අත්දුටුවයි.

*ගර්භ ඉදිමුනට කසාය*

ඉඟුරු මිරිස් අබ තුං තුං බරි   නා
එැනු අරලු එහි කල දිය රැගෙ   නා
යහුනු යබර එහි කල දිය රැගෙ   නා
නුනුනියාසිබිලි පස්කලදක් රැගෙ   නා

මේ හැම දේ ගෙන කායම කිං   නේ
බුළු පමණට උණු දියෙන් බැදින්   නේ
ලුනු ඇඹුල් ඇර සතියක් වලදන්   නේ
පසුවට ඇල් පැන් වක්කර පත්   නේ

ගර්භිණීන්ගේ ගිනියන් ඉදිමුන   ටා
කොරවා උන් හිරිවායු ද තු   ටා
සෝපත් පාණ්ඩු ගුණවෙයි එවි   ටා
අද්දුටුවාවේ කසායම එවි   ටා

ජයපාලද ඇට පතක් ද ගත්   නේ
ගොරක පලුත් තුන තුන අරගත්   නේ
මයිල මල්ද කොළ පොතු ගත්   නේ
තෙහං අලත් සමකර ගත්   නේ

බොකුල වැලක් ගෙන ඉස්මද ගත්   නේ
මෙකී මෙ ඖෂධ කකාරමින්   නේ
පෙරා තියාගෙන කෑදට පොවන්   නේ
දීපං මළකුණු කඩා වැටෙන්   නේ

*ගර්භකුස තුළ කැක්කුමට එම මාලේට*

ගැබේ සිටින බිලිඳුං නැසුනෝ ති ත්
ලොබේ වඩන අය කළ බේත නොකර ත්
වැරේ ගන්ධ නුඹ වැර නොකර ත්
ඉබේ එන්ධ දැන ඖෂධ දීප ත්

විල්ලඹු අම්මා අතින් අසන් නේ
අපලය පළමුව සොඳට අසන් නේ
පණ තිබුණොත් පණ නොරැකෙයි දන් නේ
තමහට උවමක් නැතුව යොදින් නේ

පුසිය ලතා ගෙඩි ගත්නා මැඩ ගතිනා යුස ගත් තිය තා
අර්දිකතා ගෙන කොටකා යුස තියතා නැලි මතිය තා
බුංගයුතා මැනගතිතා යුස තියතා නැලි මති තා
පෙරකියතා යුස තියතා මැන ගතිතා දුන්නු ඉ තා

*ගර්භ මාලේට*

දුරුදෙක අසමෝදිනා වග පුලිනා කුඩුකර නා
ඈදුරු වෙනා ඔසු ලවනා දෙක එකිනා කකාර නා
රුදුරු මෙනා කුස තුළිනා කැක්කුවෙනා ගති නා
එදුරු වෙනා උණ නසනා ගර්භ අඩිස්සිය ඇරෙ නා

පොල් මල් අට්ටික්කා පොතුගෙන එැ
මෙකී දොළොස් කලඳටම කිරා එැ
කිරා එකක් දිය කැකෑරුම් එැ
පතකට සිඳුවා පානය කර එැ
දසමස පහළොස් දිනකට කී වා
දොස් සියලු ගුණ කර රැක දේ වා
කී රුසිවරු මේ කසාය පෙවූ වා
ගර්භය මාලේ ලෙඩ ගුණ කෙරු වා

එලකිරි උක්පැනි කසපැං එදි යේ
දොඩං ඇඹුල් මීපැණි එක සරි යේ
සමකර කොට්ටං ගෙන වැල්මී යේ
කරාඹු වසාවාසි දුරු තිප්පිලි යේ



*ගර්භිණීන්ඩ කසාය නැටි කසාය*

වැල් කසඹිලි බැබිල ද ඉරි වෙරි යේ
කලාදුරුද පැපිල ද ඉර මුසු යේ
විල්වල පොත්තංකාතා ද යේ
සැවැන්දනට මේ මුල් එකසරි යේ

අසමොද දුනුත් සාදික්කා යේ
අල බේතුත් සමගින්ම කසා යේ
හැති කැක්කුං වෙව්ලුම් ගිනියම යේ
ගර්භිණීංඩ දීපන් මේ කසා යේ

දොඩං පතා දෙහි කොසඹ ද නැටි ගෙ න
තිකද කුඹුරු කුඩුම්රිසද නැටි ගෙ න
අඹු ආඩා කරපිංචා නැටි ගෙ න
වේලා මිරිකුළු දොඩං සැවැන් ද න
මෙකී නැටිත් මීටම එක්කර ගෙ න
කොටා එ යුස භාජන ලිප තබමි න
එලකිරි කසපැන් උප්පැණි සමගි න
දෙහිද දොඩං ඇඹුලුත් තන කිරි ගෙ න

*ගර්භිණීන්ඩ කසාය.*

දෙදුරුත් සහ අසමෝදගම් නේ
අරලු නෙල්ලි බුලු තිප්පිලි ගත් නේ
ඉඟුරු මිරිස් ලසුනාරං අරගත් නේ
කිතුල් හකුරු වැල්මී උපලි ගත් නේ

මේ හැම දේ එක සරියට අරග න
කකාරමින් අට එකට හෙලා ගෙ න
වමන ද ඉසරද ඉදිමුං නොති බෙ න
කටකෙළ වේලි වතුර පිපාසෙ න

අතපය රුදා කැක්කුම බඩේ කැක්කු ම
අත්සෙක එන බඩ රුදව නිතර ම
කටකෙළ වේලී කලු අක්කාර ම
ගර්භ ලෙඩට දෙන කසාය නිතර ම

කොහොඹ කුඹුරු පොතු මුල් ද කපා ලා
තොසව ඇවරි පිලමුල් ඌරා ද කපා ලා
පුස්ස කරුදු පොතු ගෙන කුඩු කර ලා
වැල් බැබිල ද රසක් ද එක්කර ලා

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
10 FEB 2015
පුස්තකාලය

*කන්දකුමාර අග්නි කසාය*

ඉරමුසු බැබිල ද කුප්පමේනියෙ න්
වං ඇපල ද බටුමුල් දියමිත්ත යෙ න්
සැවැන්දන ද ඉරි වේරිය සමඟි න්
නික කුඩුමිරිස ද කන්ද කුමාරයෙ න්

මෙකී මුලුත් එක හරියට ගෙන යා
කසපැන් ගෙඩියක වතුර ගෙනේ යා
කොත්තමල්ලි බෙලි මුල් ගන්නේ යා
වැල්මී කොට්ටං විලඳ ගෙනේ යා

සඳුන් ඉඟින් ඇට එැනුත් අරගන් නේ
කකාරමින් අට තුනට හෙලා ගන් නේ
සතියක් වලදා දිය වක්කර පන් නේ
මින් ගුණ වෙයි ලෙඩ රුසිවරු පවසන් නේ

පිස්සි ලවුන එන උණටත් යහප ති
අඩිස්සි ඉදිමුං උසිල ගුණ මෙ ති
වතුර පිපාසෙට දූන්නොත් යහප ති
අග්නිවාතේ නවතා බිහි වෙ ති

ලයබඩ ගිනියන් දාය උෟස්නෙ ට
කටකෙළ වේලි ජවර පිපා සෙ ට
ඉලප්පු අග්ගින්යා ඉක්කාවි ට
ජවර අටෙන් එන උනත් ගැනීම ට

ගර්භ අඟනන් හට ලෙඩ ආන න්
ඇඟපත ගිනිහං උනත් ගැනින න්
සෝපද ඇඟ පොත බරවී තිබෙන න්
කසාය දියලා පාවන කර ප න්

අමාරුවට ආවත් එ ලදුන් නේ
නැතුව රුදාවද දුකින් තැවෙන් නේ
එඬරු තෙලුත් මුසුකර දී පන් නේ
විදුලිය කෙටු සැනෙකින් බිහිවෙන් නේ

*වැදැමහ වැටෙන්ඩ*

වැදැමහ වැටෙන්ඩ ලිපකින් අලුගෙන කුඩු ගසා භාජනයකට දමා දියකර ලුනු දිය සමග පොවනු වැදැමහ වැටෙයි අත්දුටුවයි.



*ගර්භ සුද්ධ තෛලේ*

පොල් දදලුක් කිරි එළකිරි තන කිරි යෙ න්
එළ මූත්‍රා සහ තලතෙල් නැලියෙ න්
එඬරු එළඟි තෙල් නැලි දෙකකින් ග න්
තිරස්සවාලු සිවිය ද ගෙන මෙලෙසි න්

සහිදලුනු ද අක්බ්‍රා නව සාර න්
බලල් ද වෙඩි ලුනු සවුක්සාරමු න්
මෙකී සරක්කුවෙන් එක එක කලදි න්
වරා කිරෙන් අඹරා ඉටි පද මි න්

එගෙන කාසියක් පමණට වලද න්
අවහිර නොවනා ලදුන්ට දීප න්
එහෙම අයට දෙතු මාලේ ඉඟු ලු න්
බඩේ සියලු කුණ හක්කුණු අද් ද න්

එගෙන කාසියක් පමණ වල ද න්
බඩේ ගෙඩි ද අවගතියට දීප න්
කඩකිලුටුද නොවෙනා කිලි දකිමි න්
කොප්ප වායුවට ගුල්ම ලෙඩට දෙ න්

*ගර්භ මූල තෛලේ*

අවහරවෙන්නට පළමුව දීප න්
වලදා බඩග රුජාව ආන න්
ඊට බදින බෙහෙත් අසාප න්
යකවනස්ස යක්වේරිය යකුයෙ න්

ඉන්පසු සද්දින තෙල්වල දාප න්
ගැබය සුද්ද වෙයි රුසිවරු පවස න්
දරුබිජ උපතට දෝස නැත දැනග න්
ගර්භ සුද්ද තයිලේ නම් දැන ග න්

පඹුරු කොළ ද පොතු වරා කොළ ද ඉ ස
දලුද මෙකැම කහ ලුනු තෙර පැම ය
කබල් උනුව තෙල් ගා බඩ වීටම ය
බෙහෙත් බදිනු බඩපිට තුන් දිනම ය

### තිල් වැල් කසාය

අවරිය සුදු වෙල්ලංගිරිය කුඩුමිරිස ද මුල් කුඹු     රූ
නව කුඹුරුකොළ යුස පතවෙංඩගතිල්     රූ
ලසුනුකර ගන්ළසු නැ තුං කලදක් මිරිස් ඉඟු     රූ
ලවසුන භර අටියක සිද වලදනු දෙව     රූ

අංසෙක ගෙඩි කුස පිළිකා කෙප්පවාද උදර පීරුම     න්
මින් දරු ගැබ වැදුගෙයි කත ගෙඩි වාත පිරුම     න්
මින් කල් අම්යා පිළිකා මීස පිළිකා පිස්සි බැල්ම     න්
සත් සිදුවයි ගත ගැබ ගිනි දුටු ඉටි වෙඩරු පිඩක් සේ මන්

වම්මුතු කන්සා බිජු අරගන්     නේ
ඉගුරු මිරිස් සත අබ අරගන්     නේ
අරලු බුලු ද නෙල්ලි ද අරගන්     නේ
ගුගුල් සමඟ වදකහ අරගන්     නේ

### ගර්භ විපුල නවරත්න චූර්ණෙ

හීනුක් හීරැස්ස ද සමගම ගෙ     න
විදුරබයෙන් තම්බා වෙලා ගෙ     න
කුඩුකර වෙන වෙන චූර්ණ කරගෙ     න
දෙවන් දෙකලඳ බැඟින් කිරාගෙ     න

පතුක් යකාබැදි ගංසුරිය ගෙ     න
මෙකි මුලුත් උදුරා වේලා ගෙ     න
චූර්ණ කර තුං කලඳ කිරා ගෙ     න
පළමු බේත් කුඩු එක්කර ගනිම්     න

මේ හැම බරට අල බේත් කිරා ග     ත්
දෙදුරු ද උලුවා සීනක්කාර     ත්
කරාඹු වසවාසි පල්මානික්ක     ත්
වැල්මී සමඟම ගං නවසාර     ත්

අබිං පෙරුංකායත් අරගන්     නේ
පුස්කර වෙඩිලුනු ගෙන්දගොම්     නේ
කොට්ටං දෙවදුරු ලිපගත් ගන්     නේ
හිඟුරු වියලි එනසල් අරගන්     නේ

වම්මුතු කන්සා බිජු අරගන්     නේ
ඉගුරු මිරිස් සහ අබ අරගන්     නේ
අරලු බුලු ද නෙල්ලි ද අරගන්     නේ
ගුගුල් සමග වදකහ අරගන්     නේ



වනේලවා තිස් පැයක් කොටා     ගත්
සීල වැඩිකර චූර්ණ කර     ගත්
කලං බැගින් මී පැණියෙන්     දීපත්
සතියක් මෙලෙසට දෙවරුව     දීපත්

බඩත් ගනව ඇග පිපි හලු     ආනත්
උනත් නැතුව ගිනියං වාස වී     නත්
බඩත් පිපි බඩවැල පෙරලේ     නත්
කයත් බැහැර දරුගැබ දිරවා     නත්

ඉකිලිය කැක්කුම රුද කරන්     නේ
යටිබඩ කකියා ලේ බින්දන්     නේ
බඩිං අසාර්ධව සාරේ යන්     නේ
යටිබඩ ගෙඩි පෙරලෙයි දැනගන්     නේ

උදුවේලා බඩ කිලි නැතිවෙන්     නේ
නිබදව යටි බඩ උදුරා කන්     නේ
ගැබතුළ දරු බිජු අට නොගතින්     නේ
වඳ පනවා කෑ ගුණ දැනගන්     නේ

ගැබතුළ අටගත් වායු බලා     ලා
කෙප්ප වායුවට එයි හරවා     ලා
ගර්භ සූලය ද එයි මොරා     ලා
කෙප්ප වායියට එයි බිය වැද     ලා

ඊට බෙහෙත් පමණක් අරගන්     නේ
අරක්කු සහිතව යොදා පොවන්     නේ
හබරල කොළ පිට එහි ඉඳුවන්     නේ
විගසට වඳපනු වැටෙයි බොලන්     නේ

නුරා වඩන රතිකෙලි අවතා     රේ
දරාසීන පෙනෙමින් අවතා     රේ
පුරා දෙපෝය ද කෙම්මුර නෑ     රේ
සුරා දූත පනු අවතා     රේ

### ගර්භනවරත්න තෛලේ

මඟුල් කරඳ කිරි නැලියක් ගනිමින් ලොස්සුඹුල් ද නැලිය     බැගිනේ
විපුල් එභාතාවාරිය යුසගෙන නෙරලු කිරින් එපමණ     ඨගෙනේ
සිහින්ව එන තැඹිලි ද ගනිමින් කසාය වක්කර සොදි     නේ
කුහුල් නොවී සිට ක්‍රමයෙන් ක්‍රමයට පුවදීපත් වටුවෙක්     පමනේ

ත්‍රිකල ද කල ද ගනිමින් අසමොදගන් තිප්පිලි රැගෙනා
ත්‍රිවිධ ත්‍රිවර්ග දික්මඳු උර්මද දේවදර සතකුප්පා ගෙනා
නිබඳ සුවඳහොට යවකර වගපුල් ලුනු වදකහ අල රැගෙනා
පබද අගිල් අක්කාරය අරත්ත කොත්තමො බැදජීවක රැගෙනා

වරගුණ නිමලුත් නෙරුවල පියලිත් තිප්පිලි මුලං ගෙන දසි න්
තරගුණ හිංගුණ සොමිගුණ සිතමුන් පිරිසිදු එළ මූත් ගෙන තෙලසි න්
පෙරකී හැමත් ගිරමාදි එදිමුත් අඹරා සිනිඳුව තෙලට යොද න්
තිරසර පියුමක් පමණට පුලිගුන්ලා තුං දවසක් කකාර මින්

මඳු පාට ද මැඳුපාට ද එන මේ මේ තුං පදම එන කල තොලසින්
සුදු ජල පිට තෙල් බින්දුව එෑ කල රන් රුවසේ මතුවෙයි තොලසේ
සුදු මළ බුලතට රිදිපහක්ලා සිවු මුරුහට වැදලා සතොසේ
සූසායෙන්තෙල් ජලවිට බාපන් සිදුවිට හැරී රන් රුවක් ලෙසේ

පෙරා තනා තෙල් සිද්ධි යෝගයෙන් මදිමින් තෙල් හැමතාන තාර සේ
අරාජිත එන බඩ යට කැක්කුං කෙප්පසුල ගෙඩි වලට යසේ
හූරාකරන එන තුං දොස් ඉදිමුන් දයසිසැරුන් උනට යසේ
තාරාදියෙන් කිරුමට මැන දූන්නොත් ගර්භ සෝප සැමලෙඩට යසේ

වදාපු ඉක්බිති කයතිස්වෙන් කොට කුෂ්ටිමත්ත ගුණ ත්‍රිදෝස කිපෙයි
එදා පිස්සි බයලත්වී එනකොට පිස්සි කතා දෙඩවිලි බෝ වෙයි
සදා පඩුරුගෙන කොච්චර යැද්දත් අත් බඹරකුසේ ඉස කැරකෙයි
වෙදා නැතත් තෙල් නස්නව සිටි කල ගජකුට වං කෙසරිඳු සේ බිඳෙයි

ඇතුල් පතුල් විනිද එන ගිනියං පුර මෙදා සඳ ගුණ වෙන්නේ
පතුල් ඉදිමිලා සන්දි කෙටී එන වාත කට්ටු ලෙඩ ගුණ වෙන්නේ
මකුල් කාපු ලෙස මත් ගුණ ඇත්නං සෙංකමාරියයි දැන ගන්නේ
කුහුල් නොවීසිට සන්නිපිතයට සකියනි මේ තෙල් බැඳ පන්නේ

තිරස රුජාව ද දෙවුර රුජාව ද දෙපා රුජාව ද ගුණවෙන් නේ
ගර්භ රුජාව ද දෙපා රුජාව ද මර්ග රුජාව ද ගුණවෙන් නේ
තර්ග කරන එන කෝල සන්නි හැර කෝල සන්නි දහ අටම නයන් නේ
ගර්භ සෝප නවරත්න මෙමතෙලේ ගර්භයින්ඩ සරියා දෙන් නේ



ගර්භ කුඩ

පොත්තන්කානින් කයියෙල් තුවරෙල් අගත්ති ඉලපුං කුඩඩිච්චි රා
කොයියන් අයටත් විරල් ඉරච්චින් පසිපාලුන් සැමටම මිගි රා
මයියං බසකින් වාලක්කායින් මාත් ඉරච්චින් කුඩිච්චි රා
හයියෙන් නොකියත් පොයත් ගොමකින් ඇඹුල් නොදෙනු තෙල් අරින තු රා

ඉවද ත්‍රිපල් ත්‍රිකටු කත් සමව රැගෙන සුද්ද හිගු ල්
ත්‍රිවිධ සිවන්ගුරු කතබිපු තලිගු ද යවකර වග පු ල්
ගිනිදු ලෙසින් නොවරදවා වෙන වෙන ගනුවයි මෙසිය ල්
සිනි මෙඹසු සුද්ද බරට ජයපාලත් ගනුමෙ සිය ල්

අඹරා තිස්පැයක් සොදින් කරඩුවෙ අසුරා සොමි දූ
දෙදරා තුන් දොස් කිපෙමින් සෙමෙන් පිතෙන් වෙයි පුපු දූ
දැකලා තුන්දොස් කිපුවොත් දූන්නොත් මෙම ලෙස මෙබ දූ
නොරඳා තුං දොස් පලරය දූන්නොත් මෙම ලෙස මෙබ දූ

ගර්භසූරන් කනමින් කිලිකුනු මාලේ අඩිස්සි ද
රත්පිත උන දාය ද මූත්‍ර ද කැසි මුසු ඔක්කාර ද
මුඛ වෙවුලුන් සිසැරුම ද අක්කාරං පිපාසය ද
මෙකී ලෙඩට සැක නොව දෙන් සිතින් උප්පැතියෙන් සො ද

ගැබසිටිකල උප්පැතියෙන් රඹුක්බොඩ යුස සමගි න්
දරුමල ගැබ බිහිවන්නට සිනීත් වැල්මී යුස යෙ න්
ගර්භ රුජාවට මී පැනියෙන් බැරිනං දෙනු සුදු හකුරෙ න්
විරේ එන්ට හකුරෙන් දෙන් ගර්භ රසායනයකි උතු න්

ඉහත සඳහන් විස්තර අදාළ අත්වෙදපොතේ ''ක'' පත් ඉරුවේ සිට ''ඝ'' පත් ඉරුව අවසානය තෙක් කොටසට අයත් වන්නේය. ඉන් ඉදිරියට **''ඉකිවරයෝගරත්නාගරේ සත්වාස විදිය කියත්''** යන ශීර්ෂය යටතේ පද්‍ය දහසයක් සඳහන්වෙයි. දැනට මුද්‍රිත සිංහල යෝගරත්නාකරයේ (1997) එබඳු මාතෘකාවක් නොමැත. එමෙන්ම මෙහි තවත් තැනක **''කුස පිළිකාවට බේත්''** යනුවෙන් මාතෘකාවක් ඇත්තේය. **යෝගරත්නාකරයේ** එබඳු මාතෘකාවක් ද නැත. එම කොටස් ගද්‍යයෙන් විස්තර වන්නේය. **යෝගරත්නාකරයේ** නැති මෙවැනි තව ද තොරතුරු මෙහි බහුලය. **යෝගරත්නාකරය** සම්පූර්ණයෙන්ම පද්‍යයෙන් ලියුවකි. මා වෙත ලැබුණ පුස්කොළ අත්වෙදපොත ගද්‍ය හා පද්‍ය යන දෙයාකාරයෙන් ම ලියැවී තිබිණ. වෙද පරම්පරාවල විවිධතා සහ ප්‍රාදේශීය විවිධතා මේ ආකාර අත්වෙදපොත් තුළින් හඳුනා ගැනීමට පුළුවන් බව මෙයින් පෙනීයයි. මෙහි සඳහන් බෙහෙත් කීපයක් තවත් අත් වෙදපොතක එයි. එය දැනට මුද්‍රිත තල්පතේ පිළියම් දහ අටවැනි කාණ්ඩයේ (1993) එකළොස්වන පරිච්ඡේදයේ අන්තර්ගත වෙයි. එහි ගර්භිණී සූතිකා රෝග පිළියම් යටතේ එන දරුපිළිසිදීම සහ ගර්භ ලක්ෂණ යන මාතෘකා දෙකට අදාළ තොරතුරු මේ අත්වෙදපොතේ එන තොරතුරුවලට සමාන ය. පුස්කොළ අත්වෙදපොත්වල අන්තර්ගත කරුණුවල සම විෂමතා පැවැතීම ස්වාභාවිකය.

අප්‍රකටව පවතින මේ ආකාර පුස්කොළ අත්වෙදපොත් තව ද සොයාබලා අනුලේඛනය කිරීම යෝග්‍ය බව සඳහන් කරමු. ම විසින් හඳුන්වාදෙනු ලබන පුස්කොළ අත්වෙදපොතට අයත් සියලු විස්තර මෙහි අන්තර්ගත කිරීමට හැකියාවක් නොමැත. ඉතා සුලු කොටසක් පමණක් මෙහි පළකරනු ලැබේ. ගර්භිණී මාතාවන්ට අදාළ පිළියම් සැළකියයුතු ප්‍රමාණයක් එවකට දේශීය වෙදකම සතුව පැවැති බව මේවායින් තහවුරු වෙයි. ආයුර්වේද වෛද්‍ය ක්‍රමයෙනුත් දේශීය වෛද්‍ය ක්‍රමයෙනුත් මිශ්‍රව සැකසී ඇති අත්වෙදපොත්වල පාරම්පරික වෛද්‍ය විඥාපනය ගැබ්ව පවතින බව පැහැදිලිය. මේ ලියුම්කරු එබඳු වෛද්‍ය ක්‍රමයකට සම්බන්ධ නැතත්, පුරාණ ලේඛන අතරට ගැනෙන පුස්කොළ පොත්වල එන විවිධ තොරතුරු එළිදැක්වීම සඳහා උත්සාහකරන බව සටහන් කරමි.